*සැ. යු : මෙම අති විශේෂ ගැසට් පත්‍රයේ දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන් වෙනම පළ වේ.*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1909/20 - 2015 අප්‍රේල් මස 06 වැනි සඳුදා - 2015.04.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1)(අ) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් 2015 මාර්තු මස 09 වැනි දිනැති අංක 1905/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මගින් සංශෝධිත, 2015 ජනවාරි මස 18 වැනි දිනැති අංක 1897/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයේ උපලේඛනය 2015 මාර්තු මස 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2015 අප්‍රේල් මස 05 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

1A - G 21370 — 362 (2015/04)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

(1) එම නිවේදනයෙහි ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍ය (අංක 3) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 25 සහ 26 අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් ;

25. පූජා භූමි සැළසුම්කරණය හා සංවර්ධනය කිරීම
26. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
27. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

(2) එම නිවේදනයෙහි මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය (අංක 4) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "(4) මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් :-

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. නීතිය හා සාමය පවත්වාගෙන යාම හා සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කිරීම පිළිබඳ විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම
2. නීතිය හා සාමය පවත්වාගෙන යාම
3. රථවාහන ගමනාගමන පාලනය
4. ආගමන හා විගමන කටයුතු
5. ශ්‍රී ලාංකික පුරවැසිභාවයට හා උද්ර්පණයට අදාළ කටයුතු
6. පුද්ගලයින් ලියාපදිංචි කිරීම
7. අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීම හා පාලනය
8. ක්‍රිස්තියානි ආගමික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම
9. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
10. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. පොලිස් දෙපාර්තමේන්තුව
2. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
3. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
4. ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය
5. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති*

- පොලිස් ආඥාපනත
- ආගමික හා විගාමික පනත (1948 අංක 20)
- පුරවැසි පනත (1948 අංක 18)
- ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- ආදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)
- ආදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)
- උද්ර්පණ නීතිය (1977 අංක 8)
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)
- මාධක ඖෂධ සහ මනෝවර්තක නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (2008 අංක 1)
- ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර කිරීම හා පුනරුත්ථාපනය පිළිබඳ පනත (2007 අංක 54)
- ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩල පනත (1984 අංක 11)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

(3) එම නිවේදනයෙහි ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍ය (අංක 5) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "(5) ස්වදේශ කටයුතු අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් :-

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 1. ස්වදේශ කටයුතු විෂයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම<br>2. වෙනත් අමාත්‍යාංශයන්ට නිශ්චිතව පවරා නොමැති විෂයයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් මෙහෙයවීම හා පොදු අධීක්ෂණය<br>3. රාජ්‍ය උත්සව<br>4. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්<br>5. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | 1. සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල<br>2. සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල<br>3. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | ■ බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනත (1992 අංක 58)<br>■ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත<br>■ උඩරට විවාහ හා දික්කසාද පනත<br>■ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත<br>■ නොතාරිස් ආඥා පනත<br>■ ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත<br>■ ශ්‍රී ලංකා සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත<br>■ නිවාඩු පනත (1971 අංක 29)<br>■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

(4) එම නිවේදනයෙහි නාගරික සංවර්ධන, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍ය (අංක 12) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 3 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(5) එම නිවේදනයෙහි වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍ය (අංක 15) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "(15) කෘෂිකර්ම අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් :-

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු පනත්* |
|---|---|---|
| 1. කෘෂිකර්ම විෂයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, සහ ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම<br>2. කෘෂිකාර්මික භෝග විවිධාංගිකරණය<br>3. කෘෂි නිෂ්පාදන වැඩිදියුණු කිරීම | 1. කෘෂිකාර්මික හා ගොවිජන සේවා රක්ෂණ මණ්ඩලය<br>2. සීමාසහිත ලංකා පොස්පේට් සමාගම<br>3. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>4. ජාතික කෘෂිකාර්මික විවිධාංගකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම)<br>5. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය | ■ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතන පනත (1972 අංක 5)<br>■ පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත (1980 අංක 33)<br>■ ගස් හෙළීම (පාලන කිරීම) පනත (1951 අංක 9)<br>■ ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනත |

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

4. කෘෂිකාර්මික අධ්‍යාපනය
5. අධිතාක්ෂණික කෘෂිකර්ම සංවර්ධනය
6. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය පරිපාලනය සහ පිරිස් කළමනාකරණය
7. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට සම්බන්ධ කාර්යයන්
8. එළවළු සංවර්ධන මණ්ඩලයේ හා පළතුරු සංවර්ධන මණ්ඩලයේ වත්කම් හා අනෙකුත් සම්පත්වලට අදාළ කටයුතු
9. කුඹුරු භුක්තිය
10. ගොවීන්ගේ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
11. අපනයන කෘෂිභෝග සංවර්ධනය
12. කුළුබඩු හා ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලයේ වත්කම් හා අනෙකුත් සම්පත් සුරක්ෂිත කිරීම හා සම්බන්ධිත කටයුතු
13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
14. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

6. මාංශ භෝග හා ධාන්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන අධිකාරිය
7. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය
8. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
9. පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය
10. සීමසහිත ලංකා පොහොර සමාගම
11. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම
12. ජාතික පොහොර ලේකම් කාර්යාලය
13. සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස්
14. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
15. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළයුතු පනත්*

- පැළෑටි ආරක්ෂා කිරීමේ පනත (1999 අංක 35)
- බීජ වී පනත (2003 අංක 22)
- පස් සංරක්ෂණ පනත (1996 අංක 24)
- කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47)
- පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)
- ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)
- අපනයන කෘෂි සංවර්ධන පනත (1992 අංක 46)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

(6) එම නිවේදනයෙහි මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය (අංක 16) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "(16) මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් :-

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. මාර්ග සංවර්ධන අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්
2. මාර්ග නඩත්තු භාර අරමුදල
3. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
4. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම
5. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අධිකාරිය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු පනත්*

- ජාතික මංමාවත් පනත (2008 අංක 40)
- මාර්ග සංවර්ධන අධිකාරිය පනත (1981 අංක 73)
- මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (ආයෝජන මණ්ඩලය නීතිය) (1978 අංක 4)
- ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (2008 අංක 14)

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

2. උසස් තත්ත්වයෙන් යුක්ත වූ ජාතික මහාමාර්ග සහ අනෙකුත් ප්‍රධාන මාර්ගයන්ගෙන් සමන්විත මාර්ග ජාලයක් සැපයීම සහ ප්‍රශස්ථ තත්ත්වයෙන් පවත්වාගෙන යාම
3. මග නැගුම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
4. ජාතික ප්‍රතිපත්තියට අනුකූලවන පරිදි, මාර්ග පරිහරණ ගාස්තු රැස්කිරීම, පසුවිපරම් කිරීම හා සංවර්ධනය ඒකාග්‍ර කිරීමට සියලුම මහාමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආකාරය සඳහා පැහැදිලි සම්බන්ධීකරණ ක්‍රියාදාමයක් නිමවීම
5. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග පිළිබඳ ජාතික ප්‍රතිපත්ති පදනම් කොටගත් වැඩසටහන් හා ව්‍යාපෘති සකස්කිරීම සහ එම වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධීකරණය හා මෙහෙයවීම
6. විදේශීය සෘජු ආයෝජන ප්‍රවර්ධනය කිරීම
7. පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම
8. 2011 අංක 43 දරන පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතුකර ඇති පහත සඳහන් ආයතනවල ඌන උපයෝජිත වත්කම් පුනරුදය සම්බන්ධයෙන් පත්කර ඇති නිසි බලධාරීන් විසින් ඉටුකරනු ලබන ක්‍රියාකාරකම් මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම
   (i) බදුල්ලේ පිහිටි දේපල කලම්බු කොමර්ෂල් කම්පැණි
   (ii) සිනෝටෙක්ස් (ලංකා) ලිමිටඩ්
   (iii) ජැක ලංකා ලිමිටඩ්
   (iv) ජ්ලයිමත් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට් ලිමිටඩ්)
   (v) කොස්මොස් මැකී ඉන්ඩස්ට්‍රීස්
   (vi) කාබුල් ලේස් (ප්‍රයිවට් ලිමිටඩ්)
   (vii) ඉන්ටර්ට්‍රේඩ් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්
   (viii) සීතා පැෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ්
   (ix) ඩී. සී. ඇපරල් ප්‍රයිවට් ලිමිටඩ්

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළයුතු පනත්*

- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II වැනි තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු පනත්* |
| (x) නීඩ්ල් ක්‍රාෆ්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xi) හයි පැෂන් ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xii) කොලින්ස් ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xiii) රුහුණු පුතා ඇපර්ල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xiv) සන්ජය ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xv) මැක්ෆා ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xvi) යොහීදා ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xvii) ඩයනමික් ක්ලෝතින් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xviii) 609 පොලිමර්ස් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xix) කොස්කෝ පොලිමර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xx) ග්‍රේට් වෝල් ත්‍රෙඩ් මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xxi) ආදම්ජි එක්ස්ට්‍රැක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xxii) ඩාටා ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xxiii) ටෙන්ඩන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xxiv) රිකාන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xxv) කොම්පොසිට් ටවර් සොලියුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xxvi) හෙල්ත් ෆුඩ් ප්‍රඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xxvii) ශ්‍රී විරාග් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xxviii) රෝයලී එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | |
| (xxix) කොන්ටිනෙන්ටල් වනස්පති (ප්‍රයිවට්) ලිමිටඩ්" ; | | |
| 9. කුඩා හා මධ්‍ය මට්ටමේ ව්‍යවසායන් ප්‍රවර්ධනය මූල්‍යනය හා අනුග්‍රහය දැක්වීම | | |
| 10. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන් | | |
| 11. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(7) එම නිවේදනයෙහි නිවාස හා සමෘද්ධි අමාත්‍ය (අංක 18) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 5 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ආ) එහි II වැනි තීරුවෙහි 5 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(8) එම නිවේදනයෙහි අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය (අංක 19) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "(19) අධිකරණ අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් :-

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. යුක්තිය පසිඳලීම පරිපාලනය කිරීමේ යාන්ත්‍රණයට අදාළ විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන් හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් වෙනත් කිසිවෙකු වෙත පවරාදෙනු නොලැබූ යුක්තිය පසිඳලීමේ අධිකරණයන්හි පරිපාලනය පිළිබඳ කටයුතු
3. උසාවි පරිපාලනය
4. රාජය වෙනුවෙන් අපරාධ නඩු පැවරුම් හා සිවිල් නීති කෘත්‍ය
5. රජයට සහ සියලුම රජයේ දෙපාර්තමේන්තුවලට නීති උපදෙස් ලබාදීම
6. නීති කෙටුම්පත් කිරීම
7. යම් වරදකරුවකුට නියම කරනු ලැබූ දඬුවම් සම්බන්ධයෙන් සමාව දීම, එම දඬුවම් අඩු කිරීම, ලිහිල් කිරීම, ප්‍රමාද කිරීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම
8. කම්කරු විනිශ්චය සභාවන්ට අදාළ කටයුතු
9. නීතිය නැවත ලේඛනගත කිරීම හා සංග්‍රහගත කිරීම
10. නීති ප්‍රතිසංස්කරණය
11. නීති ශබ්දමාලා පිළියෙල කිරීම හා නිකුත් කිරීම
12. යුක්තිය පසිඳලීම පරිපාලනයේ ප්‍රමාදයන් වැළැක්වීම පිණිස, අධිකරණ පද්ධතියේ උපදෙස් මත වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. නීතිපති දෙපාර්තමේන්තුව
2. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව
3. බන්ධනාගාර දෙපාර්තමේන්තුව
4. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
5. බාල අපරාධකරුවන් සඳහා පුහුණු පාසල්
6. ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව
7. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
8. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය
9. ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව
10. උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
11. ශ්‍රී ලංකා නීති ආධාර කොමිසම
12. සමථ මණ්ඩල කොමිෂන් සභාව
13. මහා භාරකාර දෙපාර්තමේන්තුව
14. නීති අධ්‍යාපන සභාව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු පනත්*

- උපරිමාධිකරණ සංකීර්ණය කළමනාකරණ මණ්ඩලය පනත (1987 අංක 50)
- ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත (2001 අංක 10)
- නීති අධ්‍යාපන මණ්ඩල සභා පනත
- ණය සහන සභා ආඥාපනත
- විදේශ නඩු තීන්දු බලාත්මක කිරීමේ ආඥා පනත
- ආණ්ඩුවේ රස පරීක්ෂක (භාණ්ඩ බැහැර කිරීමේ) පනත (1988 අංක 69)
- පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත (1990 අංක 19)
- සමායතන නීතිඥ ආයතන නීතිය (1978 අංක 33)
- අධිකරණ සංවිධාන පනත (1978 අංක 2)
- උසාවි භාෂා පනත
- නීති කොමිෂන් සභා පනත (1969 අංක 3)
- නීති ආධාර පනත (1978 අංක 11)
- සමථ මණ්ඩල පනත (1988 අංක 72)
- අපරාධ වැළැක්වීමේ ආඥාපනත
- වංචා වැළැක්වීමේ ආඥාපනත
- සමාජ අබලතා වැළැක්වීමේ පනත
- ප්‍රාථමික අධිකරණ සංවිධාන පනත (1979 අංක 44)
- රාජ්‍ය (සිවිල් වරදෙහිලා වගකීම්) පනත
- බන්ධනාගාර පනත
- තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) පනත

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු පනත්* |
|---|---|---|
| 13. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපනයට අදාළ ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සකස්කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>14. බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය<br>15. අපරාධ වැළැක්වීමේ ආඥාපනත යටතේ දක්වා ඇති කාර්යයන්<br>16. ප්‍රජා පාදක විශෝධන ව්‍යාපෘති<br>17. මහා භාරකාරතැනගේ කාර්යයන්<br>18. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්<br>19. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | ■ මහා භාරකාර ආඥාපනත (1922 අංක 1)<br>■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

(9) එම නිවේදනයෙහි ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය (අංක 20) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(*අ*) එම ශීර්ෂය "(20) ජනමාධ්‍ය අමාත්‍ය" වශයෙන් ;

(*ආ*) එහි I වැනි II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් :-

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 1. ජනමාධ්‍ය විෂයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම | 1. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව<br>2. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව<br>3. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | ■ ඇසෝසියේටඩ් නිවුස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත (1973 අංක 28)<br>■ ලංකා ගුවන් විදුලි සංස්ථා පනත (1966 අංක 37) |
| 2. ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය කිරීම ඇතුළුව නිල ප්‍රවෘත්ති ජනමාධ්‍යවලට නිකුත් කිරීම | 4. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව<br>5. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | ■ ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනත |
| 3. පෞද්ගලික විමසීම්වලට ප්‍රතිචාර දැක්වීම ඇතුළුව නිත්‍ය වැඩපිළිවෙළක් ලෙස ශ්‍රී ලංකාව පිළිබඳ මූලික තොරතුරු ප්‍රචාරණය | 6. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය<br>7. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | ■ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 8)<br>■ ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනත (1973 අංක 5) |
| 4. රජයේ දෙපාර්තමේන්තුවලට තොරතුරු සැපයුම හා ප්‍රචාරක කටයුතු | 8. සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | ■ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත (1982 අංක 6) |
| 5. විදෙස්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක ද්‍රව්‍ය සැපයීම | 9. සීමාසහිත ලංකා පුවත් ආයතනය<br>10. සැලසිනේ රූපවාහිනී ආයතනය | ■ රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත (1971 අංක 47) |

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 6. ප්‍රකාශනවලට අදාළ ජාත්‍යන්තර ගිවිසුම් | 11. ක්‍රියේටිව් හෙලන්කා ලිමිටඩ් | ■ රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත (1968 අංක 24) |
| 7. දෙපාර්තමේන්තු ප්‍රකාශන හැර රජයේ ප්‍රකාශන අලෙවිය, ගබඩා කිරීම සහ නිකුත් කිරීම | 12. ජාතික චිත්‍රපට සංස්ථාව | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 8. ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය චිත්‍රපට හා නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම | 13. ශ්‍රී ලංකා රූපවාහිනී අභ්‍යාස ආයතනය | |
| 9. වාණිජ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාර සහ විදේශ විකාශනයන් ඇතුළුව ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු | 14. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි - සිනමා උද්‍යානය (රන්මිහිතැන්න) | |
| 10. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන් | | |
| 11. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(10) එම නිවේදනයෙහි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය (අංක 22) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "(22) වරාය හා නාවික අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් :-

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු පනත්* |
|---|---|---|
| 1. වරාය හා නාවික විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම | 1. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් | ■ ලංකා නැව් සංස්ථා පනත (1971 අංක 11) |
| 2. අද්මිරාල්තියට අයත් ඒවා හැර අනෙකුත් වරාය තෙල් ටැංකි සහ උපකරණ සහ ගුවන් තොටුපලවල ප්‍රදීපාගාර සහ ප්‍රදීපස්ථම්භ සංවර්ධනය සහ පරිපාලනය | 2. සීමාසහිත ලංකා නැව් සංස්ථාව සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් | ■ පහයන තටාක හා පේටන්ට් දියත් ආඥා පනත |
| 3. නාවික සේවා සැපයුම්කරුවන් හා පරිහරණය කරන්නන් අතර ආරවුල් බේරුම්කරණය | 3. වෙළඳ නාවික ලේකම් කාර්යාලය | ■ නැව් නියෝජිතයින්ට බලපත්‍රදීමේ පනත (1972 අංක 10) |
| 4. නාවික සේවාවන් සඳහා තරග රීති මාලාවන් පැනවීම | | ■ මාස්ටර්ස් ඇටෙන්ඩන්ට් ආඥා පනත |
| 5. නාවික සැපයුම්කරුවන් සහ පරිහරණය කරන්නන් අතර උපදේශාත්මක සම්බන්ධීකරණය තහවුරු කිරීම හා සහායවීම | | ■ වෙළඳ නැව් පනත (1971 අංක 52) |
| | | ■ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත (1979 අංක 51) |
| | | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II වැනි තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| *I වැනි තීරුව* <br> *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* <br> *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* <br> *ක්‍රියාත්මක කළ යුතු පනත්* |
|---|---|---|
| 6. බුන් යාත්‍රා සහ සමුද්‍ර මුක්තාවශේෂ භාරගැනීම | | |
| 7. නාවික කටයුතු සංවර්ධන අරමුදල පරිපාලනය කිරීම | | |
| 8. නැව් ගාස්තු හා නාවික සේවා කටයුතු | | |
| 9. වෙරළාසන්න මගී ප්‍රවාහනය | | |
| 10. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන් | | |
| 11. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(11) එම නිවේදනයෙහි මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍ය (අංක 31) ශීර්ෂයේ I වැනි II වැනි හා III වැනි තීරුවලට පසුව පහත සඳහන් නව ශීර්ෂයන් ඇතුළත් කිරීමෙන් :-

**(32) ආපදා කළමනාකරණ අමාත්‍ය**

| *I වැනි තීරුව* <br> *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* <br> *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* <br> *ක්‍රියාත්මක කළයුතු නීති* |
|---|---|---|
| 1. ආපදා කළමනාකරණය විෂයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම | 1. ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාව <br> 2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය <br> 3. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය <br> 4. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව <br> 5. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | ■ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13) <br> ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 2. ස්වභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන විපත්වලදී සහන සැලසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය | | |
| 3. ව්‍යසන ලිහිල් කිරීම, ප්‍රතිචාර දැක්වීම හා යථාතත්වීකරණය පිළිබඳ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය | | |
| 4. ජාතික ප්‍රතිපත්ති මත පදනම් වූ ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම හා ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සැකසීම | | |
| 5. ව්‍යසන ලිහිල් කරලීම, ප්‍රතිචාර දැක්වීම සහ යථාතත්වීකරණය පිළිබඳ විදේශීය ආධාර ව්‍යාපෘති ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය | | |

**(32) ආපදා කළමනාකරණ අමාත්‍ය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළයුතු නීති* |
|---|---|---|
| 6. ඉහත කාර්යභාරයන් නිසිවේලාවට ක්‍රියාත්මකවීම සහතික කරගැනීම පිණිස අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන හා නියෝජිතායතන, පුද්ගලික ආයතන, දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය | | |
| 7. ස්වභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම | | |
| 8. ගංවතුර, නියඟය, වසංගත රෝග සහ වෙනත් සුවිශේෂිත හේතූන් නිසා සිදුවන ආපදාවන්හි දී සහන සැලසීම | | |
| 9. ස්වභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසනවලදී ගලවාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම | | |
| 10. පෙර අනතුරු හැඟවුම් පද්ධතිය | | |
| 11. කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ | | |
| 12. නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනය | | |
| 13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන් | | |
| 14. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**(33) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළයුතු නීති* |
|---|---|---|
| 1. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම | 1. ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව<br>2. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය<br>3. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | ■ ධීවර හා ජලජ සම්පත් පනත (1996 අංක 2)<br>■ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත (1990 අංක 23) |
| 2 සමුද්‍ර, කිවුල් දිය හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය හා කළමනාකරණය | 4. සී/ස සීනෝර් පදනම<br>5. ලංකා ධීවර සංස්ථාව | ■ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත (1998 අංක 53) |

**(33) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව ක්‍රියාත්මක කළයුතු නීති* |
|---|---|---|
| 3. රජයට අයත් ධීවර යාත්‍රා කළමනාකරණය සහ/ හෝ මෙහෙයවීම | 6. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය | ▪ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය පනත (1981 අංක 54) |
| 4. අනන්‍ය ආර්ථික කලාපය තුළ ධීවර කටයුතු සංවර්ධනය සහ කළමනාකරණය කිරීම | | ▪ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 5. ධීවර වරායවල් සහා නැංගුරම් පොලවල් පිහිටුවීම, නඩත්තුව සහ කළමනාකරණය | | |
| 6. ධීවර කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය වන අයිස් යන්ත්‍රාගාර, ශීත කාමර සහ වෙනත් යටිතල පහසුකම් පිහිටුවාලීම සහ ක්‍රියාත්මක කිරීම | | |
| 7. ජීව සහ අජීව ජාතික ජලජ සම්පත් සංවර්ධනය කිරීම | | |
| 8. මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන බෙදාහැරීම හා අලෙවිකරණ කටයුතු | | |
| 9. ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම | | |
| 10. මුහුදු මත්ස්‍ය වගාව ඇතුලු ජලජීවී වගා සංවර්ධනය සහ කළමනාකරණය | | |
| 11. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන් | | |
| 12. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**(34) වාරිමාර්ග අමාත්‍ය**

| *I වැනි තීරුව කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව ක්‍රියාත්මක කළයුතු පනත්* |
|---|---|---|
| 1. වාරිමාර්ග විෂයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම | 1. වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ▪ වාරිමාර්ග ආඥාපනත |
| 2. වාරිමාර්ග සංවර්ධන වැඩසටහන | 2. ජලසම්පත් මණ්ඩලය | ▪ ජලසම්පත් මණ්ඩල පනත (1964 අංක 29) |
| 3. කරදිය බැහැර කිරීමේ යෝජනා ක්‍රම | 3. ගංගාධාර උණ වගා ව්‍යාපෘතිය | ▪ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I වැනි හා II වැනි තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 4. වැසි ජල සංරක්ෂණය | | |
| 5. ජල දූෂණය පාලනය කිරීම සහ ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම | | |

**(34) වාරිමාර්ග අමාත්‍ය (සම්බන්ධිතයි)**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළයුතු පනත්* |
|---|---|---|
| 6. ජල ගැලීම් වැළැක්වීම | | |
| 7. ගංගා, ඇළ, දොල සහ අනෙකුත් ජලමාර්ග දූෂණය වළක්වාලීම | | |
| 8. වාරිමාර්ග, ජලාපවහන හා ජලගැලීම් පාලන යෝජනා ක්‍රම ප්‍රවර්ධනය, ඉදිකිරීම, මෙහෙයවීම හා නඩත්තු කිරීම | | |
| 9. ඉංජිනේරු උපදේශන සේවා හා ඉදිකිරීම් | | |
| 10. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන් | | |
| 11. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**(35) උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළයුතු පනත්* |
|---|---|---|
| 1. උසස් අධ්‍යාපන හා පර්යේෂණ විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම | 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | ■ විශ්වවිද්‍යාල පනත (1978 අංක 16) |
| 2. විශ්වවිද්‍යාල අධ්‍යාපනය | 2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලු විශ්ව විද්‍යාල | ■ බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත (1996 අංක 26) |
| 3. උසස් අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශ මාර්ගයන් පුළුල් කිරීම | 3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලුම පශ්චාත් උපාධි ආයතන හා අනෙකුත් ආයතන | ■ ශ්‍රී ලංකාවේ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත (1981 අංක 74) |
| 4. අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයන් තුළ භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපනය | 4. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය | ■ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පනත (1995 අංක 29) |
| 5. ජාතික ඩිප්ලෝමාව සහ උසස් ජාතික ඩිප්ලෝමාව සහ උපාධි මට්ටමේ සහතික පිරිනැමීම | 5. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | ■ ශ්‍රී ලංකාවේ මූලික අධ්‍යයන ආයතන පනත (1981 අංක 55) |
| 6. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව අන්තර් ජාතික ශාස්ත්‍රීය ආයතන සහ වෙනත් සංවිධාන සමග අනුබද්ධවීම හෝ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම | 6. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන | ■ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත (1994 අංක 11) |
| 7. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන මගින් ප්‍රදානය කරනු ලබන උපාධි සහ ඩිප්ලෝමා පිළිගැනීම සඳහා අන්තර්ජාතික මට්ටමෙන් සාකච්ඡා කිරීම | 7. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයට අනුබද්ධිත සියලුම තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන | ■ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන පනත (1976 අංක 23) |
| | 8. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් | ■ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත (2014 අංක 31) |
| | 9. ජාතික පර්යේෂණ සභාව | ■ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත (2008 අංක 31) |
| | 10. ජාතික මූලික අධ්‍යයන ආයතනය | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II වැනි තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**(35) උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍ය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු පනත්* |
|---|---|---|
| 8. බෞද්ධ හා පාලි අධ්‍යයන ඉහළ නැංවීම | 11. ජාතික විද්‍යා පදනම | |
| 9. විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ | 12. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව | |
| 10. සමාජ - ආර්ථික පර්යේෂණ | 13. ග්‍රහලෝකාගාරය | |
| 11. පර්යේෂණ හා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම තුළින් පර්යේෂණ සැලසුම් කිරීම හා මෙහෙයවීම | 14. නවීන තාක්ෂණවේදය සඳහා වන ආතර් සී ක්ලාක් ආයතනය | |
| 12. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන් | 15. කාර්මික තාක්ෂණ ආයතනය | |
| 13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | 16. ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනය | |
| | 17. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | |
| | 18 ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (සාගර විශ්වවිද්‍යාලය) | |

**(36) කම්කරු අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු පනත්* |
|---|---|---|
| 1. කම්කරු සබඳතා විෂයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම | 1. කම්කරු දෙපාර්තමේන්තුව | ■ සේවක මණ්ඩල පනත (1979 අංක 32) |
| 2. කම්කරු සබඳතා, ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් සහ සේවක සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස්කිරීම සහ ක්‍රියාවට නැංවීම | 2. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ■ සේවක අර්ථසාධක අරමුදල් පනත (1958 අංක 15) |
| 3. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධානය සමග අන්තර් සහයෝගිතාව පවත්වාගැනීම | 3. සේවක අර්ථසාධක අරමුදල | ■ ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත (1956 අංක 47) |
| 4. සේවක අර්ථසාධක අරමුදල පෞද්ගලික අර්ථසාධක අරමුදල සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරීම | 4. වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණ සංවර්ධන ජාතික ආයතනය | ■ කර්මාන්ත ශාලා ආඥාපනත (1942 අංක 45) |
| 5. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම | 5. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | ■ කාර්මික ආරවුල් පනත (1950 අංක 43) |
| | 6. ශ්‍රම වාසනා අරමුදල | ■ ප්‍රසූතිකාධාර ආඥාපනත (1939 අංක 32) |
| | 7. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | ■ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතන පනත (2009 අංක 38) |
| | 8. සීමාසහිත ශ්‍රී ලංකා රැකියා පියස | ■ පාරිතෝෂික ගෙවීම් පනත (1983 අංක 12) |
| | | ■ සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත (1954 අංක 19) |

**(36) කම්කරු අමාත්‍ය (සම්බන්ධිතයි)**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු පනත්* |
|---|---|---|
| 6. කාර්මික උසාවි සම්බන්ධ කටයුතු<br>7. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම<br>8. කර්මාන්ත ශාලාවල සේවකයන්ගේ වැටුප්, සේවා නියමයන් හා කොන්දේසි, ආරක්ෂාව, සෞඛ්‍ය හා සුභසාධනය පිළිබඳ ප්‍රතිපත්ති සකස්කිරීම<br>9. විරැකියා ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමය<br>10. රැකියා නියුක්ති ආයතන විසින් ගාස්තු අය කිරීම නියාමනය කිරීම<br>11. වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>12. ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම<br>13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්<br>14. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | ■ ශ්‍රම භාරකාර අරමුදල් පනත (1998 අංක 12)<br>■ කම්කරුවන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීම (විශේෂ විධිවිධාන) පනත (1971 අංක 45)<br>■ වෘත්තීය සමිති ආඥාපනත (1935 අංක 14)<br>■ පඩිපාලක සභා ආඥාපනත (1941 අංක 27)<br>■ කම්කරු වන්දි ආඥාපනත (1934 අංක 19)<br>■ ගාස්තු අය කිරීමේ රැකියා නියුක්ති නියෝජිතායතන පනත (1956 අංක 37)<br>■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**(37) පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු නීති* |
|---|---|---|
| 1. පාර්ලිමේන්තු කටයුතු විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම<br>2. පාර්ලිමේන්තුවට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතුවලට අදාළව රජය විසින් ඉටු කළයුතු කාර්යයන්<br>3. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කාර්යය මණ්ඩලවලට සම්බන්ධ ආයතනික කටයුතු<br>4. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගේ හා ඔවුන්ගේ පවුල්වල සුභසාධන කටයුතු | | |

**(38) ගුවන්සේවා අමාත්‍ය**

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. ගුවන්සේවා විෂයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම
2. සිවිල් ගුවන්සේවා
3. ගුවන් ප්‍රවාහනය
4. ගුවන්යානා අනතුරු විමර්ශනය
5. ගුවන්යානා ලියාපදිංචි කිරීම
6. සිවිල් ගුවන්සේවා ගාස්තු නියාමනය කිරීම
7. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
8. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. සිවිල් ගුවන්සේවා අධිකාරිය
2. සීමාසහිත නාවික සහ ගුවන් සේවා තොරතුරු පර්යේෂණ පුද්ගලික සමාගම
3. සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම
4. සීමාසහිත ශ්‍රීලන්කන් එයාර් ලයින් සහ එහි පාලිත සමාගම්
5. සීමාසහිත මිහින් ලංකා (පෞද්ගලික) සමාගම

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළයුතු පනත්*

- සිවිල් ගුවන් සේවා පනත (2010 අංක 14)
- ගුවන් සංතරණ ( විශේෂ විධිවිධාන ) පනත (1982 අංක 02)
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනත (2002 අංක 34)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II වැනි තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

**(39) නිපුනතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍ය**

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම
2. වෘත්තීය සහ රැකියා මාර්ගෝපදේශ වැඩසටහන්
3. ආධුනිකත්ව පුහුණුව
4. කාර්මික අධ්‍යාපනය
5. ජාතික ඩිප්ලෝමාව සහ උසස් ජාතික ඩිප්ලෝමාව ප්‍රදානය
6. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
7. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
3. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
4. ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය
5. ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය
6. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
7. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
8. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළයුතු පනත්*

- ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පනත (1998 අංක 59)
- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනත (1984 අංක 18)
- තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත (1990 අංක 20)
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත (1995 අංක 12)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II වැනි තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

04 - 700

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.